




සිසිර දිසානායක

# ගයමුව අපි හොඳ ගීයක් !



මේ ලියවිල්ල කියවන අයටත් අනික් හැමෝටමත් ලැබුවා වූ 2013 අලුත් අවුරුද්ද කිරියෙන් පැණියෙන් ඉවතිරෙන සුභ අලුත් අවුරුද්දක් වේවා ! කියලා පන්හිඳයි, පින්සලයි, පැන්සලයි ප්‍රාර්ථනා කරනවා.

මේ තුන්දෙනාගෙ දෙසැම්බර් මාසය ගෙවුනෙ ලංකාවෙ. තුන්දෙනා එකතුවෙලා ලංකාවෙදි ගත්ත දර්ශන පින්තූර එහෙම බල බලා තවමත් ඉන්නෙ ලංකාවේ වගෙයි දැනෙන්නෙ.

"යාපනේ ගමන තමයි හරිම වටින්නෙ" පන් නාගදීපෙ දර්ශන රූපවාහිනී තිරේ බලන ගමන් කිව්වා.

"නාගදීපෙ විතරක් නෙවි; දඹකොළ පටුන, නාග විහාරෙ වාගෙ බෞද්ධාගමික සිද්ධස්ථානත් දවසින් දවස සංවර්ධනය වෙනවා දකින්න ලැබෙන එක අපේ පිනක්."

"ඇයි අලුතෙන්ම හින්දු කෝවිල් කීයක් නම් කියලා හැමදෙනාමද ? අනික් කෝවිල් අලුත්වැඩියා කරනවාට අමතරවනේ..... පින් කතාවට හවුල් වුණේ එහෙම.... හැම ආගමකින්ම මිනිස්සුන්ට හොඳ දෙයක් දෙන්න උත්සහ කරනවා. ඒ නිසා ආගමික ස්ථාන වැඩි වැඩිය හැදෙන එක හොඳයි. ඒක අපේ සංස්කෘතියටත් හොඳයි. ඒත් ඉතින් අන්තගාමී වෙලා ආගම් නිසා බේද බින්න වෙන එක තමයි හොඳ නැත්තෙ..."

"පාර තොට නම් යස අපූරුවට හදනවා. පළාතක්, රටත් දියුණු කරන්න මුලින්ම යටිතල පහසුකම් දියුණු කරන්න ඕන. මාර්ග පද්ධතිය තමයි ඒ පහසුකම් අතරෙ මුලටම එන්නෙ." පැන් තමුන්ට දැණුන දේ ගැන කතා කළා. "වියදම් නම් බොහොම සැරයි කියලයි කියන්නෙ. එකට දෙකක් විතර වියදම්ලු. වැඩිපුර වියදම් ගැන තමයි ප්‍රශ්ණෙ. මොකද ඒ පැටවෙන්නෙ සාමාන්‍ය ජනතාවටනේ. මොනව වුණත් රෑ තිස්සේ නොයක් පළාත්වලින් යාපනයට දුවන බස් ටික දැක්කම නම් හිතට දැනෙන්නෙ සතුටක්. දෙවුන්දර තුඩුවේ ඉඳන් පවා යාපනයට බස් දුවනවා. දුර ඉඳන් එන බස් දුවන්නෙ රෑට.

"පුරුදු විදියට ම යාපනේ ගොවි මහත්තුරු තමුන්ගේ වගා කටයුතු පටන් අරගෙන. ඉස්සර තිබුණ "ආඩියා ළිං" නම් දකින්න ලැබුණෙ කලාතුරකින. දැන් ජල පොම්ප පාවිච්චි කරනවා මයෙ හිතේ......"

"වෙළහෙළඳාම් පැත්තත් නරක නෑ. අලුත් සංවර්ධනය බලන්නයි, පරණ යුද්ද සුන්බුන් බලන්නයි යාපනයට යන පිරිස නිසාම වෙනම ව්‍යාපාර පටන් අරගෙන. යුද්දෙ කාලේ පිටරටවල්වලට ගිය අය පවා තමුන්ගෙ ගම්බිම් බලන්න, නෑයෝ මිත්‍රයො දකින්න යාපනයට එන්න පටන් අරගෙන. යාපනයට විතරක් නෙවි, ඒ මුළු පළාතටම මේක ආශිර්වාදයක් වෙලායි තියෙන්නෙ......

පන්හිඳ කිව්වේ තමුන්ට උගන්වපු දෙමළ ගුරුතුමියක් බලන්න ගිය වෙලාවේ ගත්ත පින්තූරය දිහා බලන ගමන්. කමලා මානික්කම් ගුරුතුමියගේ වයස දැන් අවුරුදු 75ක් විතර. එතුමියගේ ගම කොඩිකාමම් ප්‍රදේශයේ. ඒ ගෙවල් දොරවල් යුද්දෙන් විනාශ වෙලා හන්දා දැන් ඉන්නෙ තමුන්ගේ පුතා ළඟ; වව්නියාවේ. අවිස්සා-වේලේලේ සීතාවක මහා විද්‍යාලයේ උගන්නපු කාලේ "මානික්කම් මිස්" නැවතිලා උන්නෙ පන්ලගෙ ගෙදර. ඒ පන්ගේ පියාත් හොඳට දෙමළ කතා කරන්න දැනගෙන උන්නු ඒ ඉස්කෝලෙම උගන්නපු ගුරුවරයෙක් හන්දා. පන් "මානික්කම් මිස්ට" කිව්වෙ "මානි ඇන්ටි" කියලා. පුංචි කාලෙ කොඩිකාමම් වල තිබුණු මහ ගෙදරට "මානි ඇන්ටි" එක්ක නිවාඩුවට ගිහින් හිටිය හැටි පන්ට තාම මතකයි.

"දෙමළ අයත් අපේ අය වගේම ආගන්තුක සත්කාරයට බොහොම ලැදියි. ලෙන්ගතුයි." පන් කිව්වා.
"ඔව් ඉතින් ත්‍රස්තවාදියො කියන්නෙ වෙනම කණ්ඩායමක්නෙ..... ත්‍රස්තයෝ කියන්නේ ත්‍රස්තයෝ......" පැන් හූම් මිටි තිව්වා.

පන් පස්සෙ කාලෙක "මානි ඇන්ටි" ගෙන් ඒ ලබපු අත් දැකීම් එක්ක සින්දුවක් ලිව්වා මෙන්න මෙහෙම:

"තල් සූකිරි අරන් එන්න
උළුඳු වඩෙ අරන් එන්න

මානික්කම් - මානික්කම්
කොණ්ඩ කැවුම් රස බලන්න
කිතුල් හකුරු මුල ලිහන්න
මං ඉන්නම් - නුඹ එනකල්......"

"ආ" නා - "ආ" වන්නා
"අ" - යනු - "ආ" යන්නේ ගලපා
ගයමුව අපි හොඳ ගීයක්
එක් වී එක ම හඬින් !

"ඊ" නා කියවා
"ඈ" යනු පෙන්වා
අකුරේ හැඩ රුව හඳුනාගන්නට
හඳුනා හදවත් කියවාගන්නට
ලියමුව අපි යස අරුතක්
සිංහල - දෙමළ බසින් !

නටඹුන් අතරේ
සෙල්ලිපි අකුරේ
නො ලියූ නෑ කම් ලියලා එන්නට
ඒ ලෙන්ගතුකම් ඉතිරී යන්නට
තනමුව අප රස තනුවක්
මෘදංග - රබන් හඬින් !

ඔය සින්දුව ගායනා කරපු ලලිත් අරුණශාන්ත නිති කනගරත්නම් ද්‍රවිඩ සංගීතවේදියා ලවා දෙමළ භාෂාවටත් පරිවර්තනය කරගෙන සින්දුව දෙමළෙනුයි ඒ තාලයටම ගායනා කළා. සිංහල සින්දුවයි දෙමළ සින්දුවයි දෙකම සංගත තැටියකට දමලා "මානි ඇන්ටිට" තෑගි දෙන්න පන් අමතක කළේ නෑ. නිති කනගරත්නම් මහත්තයාගේ දෙමළ වචන ටිකත් එක්ක ඒ සින්දු දුන්න වෙලාව හරි හැඟීම්බර මො-හොතක් වුණා.

"දෙමළ භාෂාවෙ "ඈ" ශබ්දය නෑ නේද කියලා ඒ දවස්වල අපේ තාත්තා මානි ඇන්ටිගෙන් අහනවා මතකයි......" පන් මතක් කළා. එතකොට මානි ඇන්ටි උත්තර දුන්නෙ මෙහෙම.

"එයි නෙත්තෙ.....? (ඇයි නැත්තෙ ?)"

සාමාන්‍යයෙන් මේ වගේ උතුරුකරේට යන ගමන්වලද සහයට එකතු කරගන්නෙ හමුදාවේ හරි පොලිසියේ හරි කෙනෙක්. ඒත් පන්, පින්, පැන්ලගේ මේ ගමනේ යාපනය කොටස ආවරණය කරලා දුන්නේ "ජේකබ්" කියන ද්‍රවිඩ ජාතික තරුණයා. එයාට රසූ මහත්මයත් එකතු වුණා. ඔවුන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන් ම තොරතුරු කියද්දි අපේ අයට තේරුන් සිංහලත්, ඉංග්‍රීසිත් විතරයි.

"ඇයි මොකද අපිත් දෙමළ ඉගෙන ගත්තනම් වෙන්නේ ?" පින් ඇහුවා.

